# ව්‍යවසායකත්ව අධ්‍යයනය

## ⑥

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 11 ශ්‍රේණිය

## ව්‍යාපාර සංවිධාන

(1) පහත ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුරු යටින් ඉරක් අඳින්න.

1. පොදු අරමුණක් ඉටු කර ගැනීම පිණිස ඒකරාශි වූ පුද්ගල කණ්ඩායමක්

    1) ව්‍යාපාර වේ  2) සංවිධාන වේ
    3) වෙළෙඳ ආයතන වේ  4) හවුල් ව්‍යාපාර වේ

2. මිනිස් අවශ්‍යතා වුවමනා සපුරාලන, සීමිත සම්පත් භාවිතයෙන් ලාභ ඉපයීම, සමාජ සුභසාධනය හෝ වෙනත් අරමුණක් ඉටු කර ගැනීම පිණිස භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය හා බෙදා හරින ආයතන,

    1) වෙළෙඳ ව්‍යාපාර වේ  2) පොදු සමාගම් වේ
    3) ව්‍යාපාර සංවිධාන වේ  4) ව්‍යාපාර වේ

3. ව්‍යාපාර සංවිධානයක් විසින් සෑම විටම පාරිභෝගිකයාට සපයන්නේ,

    1) භාණ්ඩ ය  2) සේවා ය
    3) නිෂ්පාදන ය  4) භාණ්ඩ හා සේවා ය

4. ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,

    1) පොදු අරමුණක් පැවතීම ය  2) ලාභ ලැබීම ය
    3) සේවා සැපයීම ය  4) භාණ්ඩ නිෂ්පාදනය කිරීම ය

5. ව්‍යාපාර සංවිධානයක් මඟින් සපුරාලනු ලබන්නේ,

    1) අවශ්‍යතා ය  2) වුවමනා ය
    3) අවශ්‍යතා හා වුවමනා ය  4) භාණ්ඩ හා සේවා ය

6. ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,

    1) සීමිත සම්පත් භාවිතයයි  2) ආර්ථික කටයුත්තක නියැලීමයි
    3) පොදු අරමුණක් පැවතීමයි  4) නිෂ්පාදනය හා බෙදා හැරීමයි

7. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම පිණිස ව්‍යාපාර සංවිධාන විසින් සපයනු ලබන්නේ,

    1) භාණ්ඩ හා සේවා ය  2) ආහාර සහ ඇඳුම් ය
    3) බැංකු සහ රක්ෂණ සේවා ය  4) භාණ්ඩ ය

8. ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමට යොදා ගන්නා නිර්ණායක ඇතුළත් පිළිතුර වන්නේ,

    1) රාජ්‍ය හා පෞද්ගලික  2) හිමිකාරීත්වය සහ අරමුණ
    3) ලාභ අරමුණු කරගත් හා ලාභ අරමුණු කර නොගත්  4) පෞද්ගලික හා පොදු

9. ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ ප්‍රධාන නිර්ණායක,
   1) දෙකකි  2) තුනකි
   3) හතරකි  4) පහකි

10. ව්‍යාපාරවලට පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් මූල්‍ය සම්පත් යොදා ඇති විට ඒවායේ හිමිකාරීත්වය,
   1) රාජ්‍ය අංශය සතු වේ  2) පොදු අංශය සතු වේ
   3) පෞද්ගලික අංශය සතුවේ  4) දෙපාර්තමේන්තු සතු වේ

11. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන ඇතුළත් පිළිතුර වන්නේ,
   1) කේවල ස්වාමි ව්‍යාපාර, රාජ්‍ය සමාගම්  2) දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා
   3) හවුල් ව්‍යාපාර, රාජ්‍ය සංස්ථා  4) පෞද්ගලික සමාගම්, වරලත් ව්‍යාපාර

12. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන ඇතුළත් පිළිතුර නොවන්නේ,
   1) තනි පුද්ගල ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් ය
   2) වරලත් ව්‍යාපාර, හවුල් ව්‍යාපාර ය
   3) රාජ්‍ය සමාගම්, දෙපාර්තමේන්තු ය
   4) හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් ය

13. රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,
   1) වරලත් ව්‍යාපාර, රාජ්‍ය සමාගම් ය
   2) රාජ්‍ය සංස්ථා, පෞද්ගලික සමාගම් ය
   3) රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම් ය
   4) කේවල ස්වාමි ව්‍යාපාර, සංස්ථාපිත සමාගම් ය

14. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන ආකාරය දක්වන්න.
   1) පෞද්ගලික සහ පොදු අංශයේ ව්‍යාපාර
   2) කෙටි කාලීන අරමුණු සහ දිගු කාලීන අරමුණු සහිත ව්‍යාපාර
   3) රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර
   4) ලාභ අරමුණු කරගත් සහ ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර

15. රජය මූල්‍ය සම්පත් යොදා ඇති ව්‍යාපාරයක් වන්නේ,
   1) නිමල් ස්ටෝර්ස්  2) දුම්රිය දෙපාර්තමේන්තුව
   3) සී/ස ආලෝක පොදු සමාගම  4) මැක්ඩොනල්ස්

16. පෞද්ගලික අංශයේ හිමිකාරීත්වය සහිත ව්‍යාපාර ආයතනයක් වන්නේ,
   1) සී/ස දිනුග (පෞද්) සමාගම  2) තැපැල් දෙපාර්තමේන්තුව
   3) සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව  4) ඖෂධ නීතිගත සංස්ථාව

17. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර ආයතනයක් නොවන්නේ,
   1) ලංකා හොස්පිට්ල්ස්  2) සම්පත් බැංකුව
   3) යුනිවෙලා ගාමන්ට්ස්  4) රතු කුරුස සංවිධානය

18. පිරිවැයක් දරමින් භාණ්ඩ හා සේවා සැපයීමෙන් සමාජයීය වශයෙන් ප්‍රතිලාභ ලබාදීමට පවතින ව්‍යාපාර වන්නේ,

1) පෞද්ගලික අංශයේ ව්‍යාපාර ය
2) ලාභ අරමුණු කරගත් ව්‍යාපාර ය
3) ලාභ අරමුණු කරනොගත් ව්‍යාපාර ය
4) සුපිරි වෙළෙඳසැල් ය

19. ලාභ අරමුණු කරගත් ව්‍යාපාර ආයතනයක් වන්නේ,

1) කාගිල්ස් ෆුඩ්සිටි
2) රතු කුරුස සංවිධානය
3) සවිය ක්‍රීඩා සංගමය
4) සිංහ සමාජය

20. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයක් වන්නේ,

1) ලංකා බැංකුව
2) සර්වෝදය
3) බ්‍රැන්ඩික්ස් ඇඟළුම් ආයතනය
4) කීල්ස් සුපිරි වෙළෙඳසැල

21. ව්‍යවසායකයෙකුට සුළු ප්‍රාග්ධනයකින් ඉතා පහසුවෙන් ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය වනුයේ,

1) හවුල් ව්‍යාපාර ය
2) කේවල ස්වාමි ව්‍යාපාර ය
3) සංස්ථාපිත සමාගම් ය
4) වරලත් ව්‍යාපාර ය

22. තනි පුද්ගල ව්‍යාපාරයක ලක්ෂණයක් වන්නේ,

1) වගකීම් සීමිත වීම
2) අඛණ්ඩ පැවැත්මක් තිබීම
3) ලියා පදිංචිය අනිවාර්ය නොවීම
4) කොටස් කරුවන් මඟින් ප්‍රාග්ධනය රැස්කිරීම

23. කේවල ස්වාමි ව්‍යාපාරයකට ව්‍යාපාරයේ නමින් බැංකු ණයක් ලබා ගැනීමට නොහැකි වනුයේ,

1) වගකීම් අසීමිත වීම නිසා
2) නෛතික පුද්ගලභාවයක් නොමැති නිසා
3) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම නිසා
4) හිමිකාරීත්වය තනි පුද්ගලයෙකු සතු වීම නිසා

24. කේවල ස්වාමි ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම නිර්දේශ කර ඇත්තේ,

1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පණතෙනි
2) 2007 අංක 07 දරණ සමාගම් පනතෙනි
3) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනතෙනි
4) 1840 අංක 07 දරණ වංචා වැලැක්වීමේ ආඥා පනත

25. කේවල ස්වාමි ව්‍යාපාරයක ව්‍යාපාරිකයා සතු පෞද්ගලික දේපල පවා ව්‍යාපාරයේ වගකීම් පියවීම සඳහා කැප කිරීමට සිදු වීමෙන් අදහස් වන්නේ,

1) අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීමයි
2) ලියා පදිංචිය අනිවාර්ය නොවීමයි
3) නෛතික පුද්ගලභාවයක් නොමැති වීමයි
4) වගකීම අසීමිත වීමයි

26. කේවල ස්වාමි ව්‍යාපාරයක ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් පසු ලබා දෙන සහතිකය වන්නේ,

1) ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයයි
2) සංස්ථාපිත සහතිකයයි
3) වෙළෙඳ සහතිකයයි
4) ව්‍යාපාර ලියාපදිංචි සහතිකයයි

27. කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ බලධාරියා වන්නේ,

1) ග්‍රාම නිලධාරීවරයාය
2) ප්‍රාදේශීය ලේකම්වරයාය
3) දිස්ත්‍රික් ලේකම්වරයාය
4) සමාගම් රෙජිස්ටාර්වරයාය

28. කේවල ස්වාමි ව්‍යාපාරයක වාසියකි.

1) සියලුම ලාභ අයිතිකරු සතු වීමයි
2) විධිමත් හා ඉහළ පිළිගැනීමක් පැවතීම
3) සාමූහික තීරණ ගත හැකි වීම
4) අඛණ්ඩ පැවැත්මක් තිබීම

29. කේවල ස්වාමි ව්‍යාපාරයක අයිතිකරුගේ අභිමතය පරිදි සිදු කළ නොහැක්කේ,

1) සේවකයන් බඳවා ගැනීම
2) සේවකයන් ඉවත් කිරීම
3) ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කිරීම
4) ව්‍යාපාරය නමින් බැංකු ණය ගැනීම

30. කේවල ස්වාමි ව්‍යාපාරයක අවාසියකි.

1) ව්‍යාපාරයක තොරතුරුවල රහස්‍ය බව ආරක්ෂා වීම.
2) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
3) පවුලේ සාමාජිකයන්ගේ සහය ලබා ගත හැකි වීම
4) ව්‍යාපාරය ආරම්භ කිරීම පහසු වීම

31. කේවල ස්වාමි ව්‍යාපාරයක සීමාවක් නොවන්නේ,

1) තනිව ගනු ලබන තීරණ ඇතැම් විට අසාර්ථක වීම
2) වගකීම් අසීමිත වීම
3) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
4) ව්‍යාපාරය ආරම්භ කිරීම පහසු වීම

32. ලාභ ලැබීමේ අරමුණින් පුද්ගලයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් අතර පවතින එකඟතාව,

1) තනි පුද්ගල ව්‍යාපාරයකි
2) හවුල් ව්‍යාපාරයකි
3) සංස්ථාපිත සමාගමකි
4) වරලත් ව්‍යාපාරයකි

33. හවුල් ව්‍යාපාර ලෙස තම ව්‍යාපාරය පවත්වාගෙන යන ක්ෂේත්‍රවලට අදාළ නොවන්නේ,

1) ගණකාධිකාරී සහ නීතිඥ
2) බදු සහ වෛද්‍ය
3) නිෂ්පාදන සහ වෙළෙඳ
4) බැංකු සහ රක්ෂණ

34. හවුල් ව්‍යාපාරයක සිටිය හැකි හවුල්කරුවන් ගණන නිවැරදිව දැක්වෙන පිළිතුර වනුයේ,

1) අවම 02, උපරිම 20
2) අවම 01, උපරිම 50
3) අවම 02, උපරිම 10
4) අවම 02, උපරිම සීමාවක් නැත

35. හවුල් ගිවිසුමක් ඇතිවිය හැකි ආකාර,

1) එකකි
2) දෙකකි
3) තුනකි
4) හතරකි

36. හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාරයක් නොවන්නේ,

1) ලිඛිතවය
2) ලියාපදිංචි කිරීමෙන්ය
3) වාචිකවය
4) ව්‍යංගයෙන්ය

37. හවුල් ගිවිසුමක් පවත්වාගෙන යෑම වඩාත් යෝග්‍ය වන්නේ කවර ආකාරයෙන්ද?

1) ඇඟවීමෙන්ය
2) වාචිකවය
3) ව්‍යංගයෙන්ය
4) ලිඛිතවය

38. ගිවිසුම වෙනස්වීම, හවුල් කරුවකුගේ මරණය, උමතුවීම, බුන්වත් වීම නිසා හවුල් ව්‍යාපාරයේ පැවැත්මට බාධා ඇතිවන්නේ එහි,

1) නෛතික පුද්ගලභාවයක් නොමැති නිසාය
2) අඛණ්ඩ පැවැත්මක් නොමැති නිසාය
3) වගකීම අසීමිත වීම නිසාය
4) ලියාපදිංචිය අනිවාර්ය නොවීම නිසාය

39. හවුල් කරුවන් විසින් ඇති කර ගන්නා ගිවිසුම්ගත ලිඛිත එකඟතාවය,

1) හවුල් ගිවිසුම වේ
2) හවුල් ඔප්පුව වේ
3) සංස්ථාපිත සහතිකය වේ
4) ලියාපදිංචි සහතිකය වේ.

40. හවුල් ගිවිසුමක ඇතුළත් විය හැකි එකඟතාවක් නොවන්නේ,

1) ප්‍රාග්ධනය සපයන ආකාරයයි
2) ලාභ පාඩු ලබා ගන්නා ආකාරයයි
3) ව්‍යාපාර කටයුතුවලට දායකවන ආකාරයයි
4) වෙළෙඳපොළ විශ්ලේෂණය සිදු කරන ආකාරයයි

41. හවුල් ව්‍යාපාරයක වාසියක් ඇතුළත් පිළිතුර වන්නේ,

1) ලාභ තනිව භුක්ති විඳිය හැකි වීම
2) සෑම හවුල්කරුවකුම සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු වීම
3) සාමූහික තීරණ ගත හැකි වීම
4) නෛතික පුද්ගලභාවක් නොමැති වීම

42. හවුල් ව්‍යාපාරයක අවාසියක් නොවන්නේ,

1) ලාභය හවුල්කරුවන් අතර බෙදීයාම
2) හවුල්කරුවන් අතර ගැටුම් ඇති විය හැකි වීම
3) වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකිවීම
4) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම

43. බොහෝ ව්‍යවසායකයින් සංස්ථාපිත සමාගමක් ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන්නේ,

1) එක් පුද්ගලයෙකුට වුවද ආරම්භ කළ හැකි නිසාය
2) බලපාන නීති රීති අවම වීම නිසාය
3) වගකීම අසීමිත වීම නිසාය
4) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම නිසාය

44. සංස්ථාපිත සමාගම ආරම්භ කිරීම සම්බන්ධයෙන් බලපවත්නා පනත වන්නේ,

1) 1890 හවුල් ආඥා පනත
2) 2007 අංක 07 දරණ සමාගම් පනත
3) 1918 අංක 056 දරණ ව්‍යාපාර නාම ආඥා පනත
4) 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත

45. සීමාසහිත පෞද්ගලික සමාගමක සිටිය හැකි සාමාජික සංඛ්‍යාව වන්නේ,

1) අවම 02, උපරිම 20
2) අවම 01, උපරිම සීමාවක් නැත
3) අවම 01, උපරිම 50
4) අවම 01, උපරිම 20 කි

46. සීමාසහිත පෞද්ගලික සමාගමකට අදාලව වැරදි ගැලපුම වනුයේ,

1) කොටස් මිලදී ගන්නා ලෙස මහජනතාවට ආරාධනා කළ නොහැක
2) වගකීම සීමිත වේ
3) අඛණ්ඩව පැවැත්මක් සහිත වේ
4) නෛතික පුද්ගලබවක් නොමැති වේ

47. සංස්ථාපිත සමාගම්වලට සමාගමේ නමින් වත්කම් මිලදී ගැනීමට, ගිවිසුම්වලට එළඹීමට හැකි වන්නේ එහි,

1) නෛතික පුද්ගලභාවයක් පැවතීම නිසාය
2) කොටස්කරුවන්ගේ වගකීම සීමාසහිත වීම නිසාය
3) අඛණ්ඩව පැවැත්මක් තිබීම නිසාය
4) සමාගම් පනත යටතේ ලියාපදිංචි කිරීම නිසාය

48. සීමාසහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීමේ බලධාරියා වනුයේ,

1) ප්‍රාදේශීය ලේකම් විසිනි
2) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසිනි
3) දිස්ත්‍රික් ලේකම් විසිනි.
4) ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසිනි.

49. සීමාසහිත පෞද්ගලික සමාගමක ලියාපදිංචි සහතිකය වනුයේ,

1) ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයයි.
2) සංස්ථාපන සහතිකයයි
3) වෙළෙඳ සහතිකයයි
4) සාංගමික ව්‍යවස්ථාවලියයි.

50. සංස්ථාපිත සමාගමක ප්‍රාග්ධනය රැස්කර ගනු ලබන්නේ,

1) වත්කම් විකිණීමෙනි
2) නෑදෑ හිතමිතුරන්ගෙනි.
3) කොටස් ප්‍රාග්ධනයෙනි.
4) හවුල්කරුවන්ගෙනි.

51. සීමාසහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීමට අනුමත අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන සංඛ්‍යාව

1) එකකි.
2) දෙකකි.
3) තුනකි.
4) හතරකි.

52. සී/ස පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීමේදී ඉදිරිපත් කළ යුතු ලේඛණයක් නොවන්නේ,

1) ග්‍රාම නිලධාරි වාර්තාව
2) සමාගමේ නම පිළිබඳ ප්‍රකාශය
3) සාංගමික ව්‍යවස්ථාවලිය
4) අධ්‍යක්ෂකවරු ලෙස කටයුතු කිරීමට කැමැත්ත පිළිබඳ ප්‍රකාශ

53. සාංගමික ව්‍යවස්ථාවලිය යනු,

1) සමාගමක අධ්‍යක්ෂක මණ්ඩලයේ තොරතුරු ඇතුලත් ප්‍රකාශයයි.
2) සමාගමේ ලේකම්වරයා ලෙස කටයුතු කිරීමට කැමැත්ත පිළිබඳ ප්‍රකාශයයි
3) සමාගමේ නම පිළිබඳ ප්‍රකාශයයි.
4) සමාගමේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධ තොරතුරු ඇතුළත් ප්‍රකාශයයි

54. සීමිත පෞද්ගලික සමාගම්වල වාසියක් ඇතුළත් පිළිතුරක් නොවන්නේ,

1) වගකීම සීමිත වීම.
2) නෛතික පුද්ගලභාවයක් හිමි වීම.
3) අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.
4) එක් පුද්ගලයෙකුට වුවද ආරම්භ කළ හැකි වීම.

55. සීමාසහිත පෞද්ගලික සමාගමක දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,

1) සමාගමේ කොටස් මිලට ගැනීමේ මහජනතාවට ආරාධනා කළ හැකි වීම.
2) අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කිරීම.
3) අවම සාමාජිකයින් 01ක් සහ උපරිම 50 ක් වීම
4) නෛතික පුද්ගලභාවයක් හිමි වීම.

56. සීමාසහිත පෞද්ගලික සමාගමක සීමාවක් දැක්වෙන පිළිතුර වනුයේ,

1) විධිමත් බවක් සහ ඉහළ පිළිගැනීමක් පැවතීමය..
2) වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගැනීමට අපහසු වීමය.
3) පවුලේ සාමාජිකයින්, හිතමිතුරන් සම්බන්ධ කරගෙන ආරම්භ කළ හැකි වීමය.
4) නෛතික පුද්ගලභාවයක් තිබීමය.

57. තම වෙළෙඳ නාමය යටතේ එම නිෂ්පාදිතය අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට බලය පවරන්නේ,

1) කේවල ස්වාමි ව්‍යාපාර වලය.
2) හවුල් ව්‍යාපාර වලය..
3) වරලත් ව්‍යාපාර වලය..
4) සීමිත පෞද්ගලික සමාගම් වලය.

58. වරලත් ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව,

1) දෙකකි
2) තුනකි
3) හතරකි
4) පහකි.

59. වරලත් ව්‍යාපාර හා සම්බන්ධ පාර්ශ්ව ඇතුළත් පිළිතුර වන්නේ,

1) කොටස් හිමියා සහ වරලත් හිමියාය
2) හවුල්කරුවා සහ වරලත්කරුය.
3) වරලත්ලාභියා සහ වරලත් හිමියාය.
4) වරලත් ලාභියා සහ කොටස්කරුය.

60. වරලත් ව්‍යාපාර හා සම්බන්ධ දෙපාර්ශ්වය අතර පවතින ගිවිසුම්ගත සම්බන්ධතාවය,

1) වරලත් ගිවිසුමයි.
2) හවුල් ගිවිසුමයි.
3) වරලත් ඔප්පුවයි
4) හවුල් ඔප්පුවයි.

61. වරලත් හිමියා විසින් තම වෙළෙඳ නාමය යටතේ භාණ්ඩ හා සේවා විකිණීම වෙනුවෙන් වරලත් ලාභියාගෙන් අය කරන ගාස්තුව වන්නේ,

1) විකුණුම් කොමිස් ය
2) පුරස්කාරය යි.
3) නියෝජිත ගාස්තු ය.
4) පොළිය යි.

62. වරලත් ව්‍යාපාරයකින් වරලත් ලාභියාට අත්කර ගත හැකි වාසියක් නොවන්නේ,

1) වරලත් හිමියාගේ කීර්තිනාමයෙන් ලාභයක් ඉපයීමට හැකි වීම.
2) ජනප්‍රිය වෙළෙඳපොළකට පහසුවෙන් ප්‍රවේශ විය හැකි වීම.
3) කළමණාකරණ පුහුණුවක් ලැබීම.
4) ආයෝජනයකින් තොරව වෙළෙඳපොළ පුළුල් කර ගත හැකි වීම.

(2) **පහත ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

1. ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ හතරක් දක්වන්න.
2. ව්‍යාපාර සංවිධාන වර්ග කරන ප්‍රධාන නිර්ණායක නම් කරන්න.
3. හිමිකාරිත්වය අනුව ව්‍යාපාර වර්ග කර දක්වන්න.
4. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන නම් කරන්න.
5. රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන නම් කරන්න.
6. අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන්න.
7. ලාභ ඉපයීම අරමුණු කරගත් ව්‍යාපාර සඳහා නිදසුන් තුනක් දක්වන්න.
8. සමාජයීය ප්‍රතිලාභ ලබාදීම අරමුණු කරගත් ව්‍යාපාර සඳහා නිදසුන් තුනක් දක්වන්න.
9. ශ්‍රී ලංකාවේ පවතින ලාභ අරමුණු කරගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර වර්ග තුනක් නම් කර ඒ එක් එක් වර්ගය සඳහා උදාහරණය බැගින් දක්වන්න.
10. කේවල ස්වාමි ව්‍යාපාරයක මූලික ලක්ෂණ හතරක් දක්වන්න.
11. කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ව්‍යවසායකයෙකුට ඒ සඳහා ප්‍රාග්ධනය සපයා ගත හැකි ආකාර දෙකක් දක්වන්න.
12. ඒක පුද්ගල ව්‍යාපාරයක අයිතිකරුගේ වගකීම අසීමිත වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
13. කේවල ස්වාමි ව්‍යාපාරයක් වන "අරුණ වෙළෙඳසැල" අරුණ පෙරේරාට අයත්ව පවතී . පාරිභෝගිකයෙකු අරුණ වෙළෙඳසැලට එරෙහිව නඩු පැවරීමක් සිදු කර ඇත.
 කේවල ස්වාමි ව්‍යාපාරයක මූලික ලක්ෂණවලට අදාළව ඉහත තත්ත්වය පැහැදිලි කරන්න .
14. හවුල් ව්‍යාපාරයක් අවසන් කරන අවස්ථාවේදී බාහිර පාර්ශ්වයන්ගෙන් ලබාගත් ණය පියවීමට හවුල් ව්‍යාපාරයේ මුදල් ප්‍රමාණවත්නොවුණි. මෙම සිදුවීම හවුල් ව්‍යාපාරයේ වගකීම අසීමිත වීම යටතේ පැහැදිලි කරන්න.
15. කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කළ යුතු ලේඛන මොනවාද?
16. කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදංචි කිරීමේ බලධාරියා නම් කරන්න.
17. කේවල ස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කිරීමෙන් ව්‍යවසායකයෙකුට ඇති වාසි 4ක් නම් කරන්න.
18. කේවල ස්වාමි ව්‍යාපාරවල සීමා 4 ක් දක්වන්න.
19. හවුල් ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණ හතරක් සඳහන් කරන්න.
20. හවුල් ගිවිසුමක් ඇතිවිය හැකි ආකාර නම් කරන්න.
21. හවුල් ගිවිසුමක් ලිඛිතව පවත්වා ගැනීමේ වැදගත්කම දක්වන්න.
22. හවුල් ඔප්පුව යන්න හඳුන්වන්න.
23. හවුල් ගිවිසුමක ඇතුළත් කරුණු 4 ක් දක්වන්න.
24. හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාමේ වාසි දෙකක් සඳහන් කරන්න.
25. හවුල් ව්‍යාපාරයක පවතින සීමා 4 ක් සඳහන් කරන්න.
26. සංස්ථාපිත සමාගම්වල දැකිය හැකි මූලික ලක්ෂණ හතරක් ලියා දක්වන්න.
27. සීමාසහිත පෞද්ගලික සමාගමක සාමාන්‍ය පරිපාලනය සම්බන්ධ තොරතුරු ඇතුළත් ලියවිල්ල කුමක්ද?
28. සාංගමික ව්‍යවස්ථාවලියක ඇතුළත් තොරතුරු දෙකක් සඳහන් කරන්න.
29. සීමාසහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීමේදී අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලියවිලි මොනවාද?
30. සීමාසහිත පෞද්ගලික සමාගමක් ලියාපදිංචි කිරීමේ බලධාරියා නම් කරන්න.
31. සංස්ථාපන සහතිකය යනු කුමක්ද?
32. සී/ස පෞද්ගලික සමාගමක ලක්ෂණ 4 ක් දක්වන්න.
33. සීමාසහිත පෞද්ගලික සමාගමක් ආරම්භ කිරීමෙන් ව්‍යවසායකයෙකුට ලැබෙන වාසි දෙකක් දක්වන්න.
34. සීමාසහිත පෞද්ගලික සමාගම්වල දැකිය හැකි අවාසියක් දක්වන්න.
35. වර්තමානයේදී වරලත් ව්‍යාපාර පැවතිය හැකි විවිධ ස්වරූප නම් කරන්න.

36. වරලත් ව්‍යාපාර හා සම්බන්ධ පාර්ශ්ව ලියා දක්වන්න.
37. වරලත් ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යාම පිළිබඳ පොදු එකඟතා ඇතුළත් ලියවිල්ල කුමක්ද?
38. වරලත් ගිවිසුමට ඇතුළත්වන පාර්ශ්ව නම් කරන්න.
39. වරලත් ලාභියා විසින් වරලත් හිමියාට ගෙවන ගාස්තුව කුමක්ද?
40. වරලත් ගිවිසුමක ඇතුළත් කරනු ලබන පොදු එකඟතා දෙකක් දක්වන්න.
41. වරලත් ව්‍යාපාරවල දැකිය හැකි මූලික ලක්ෂණ දෙකක් දක්වන්න.
42. වරලත් ව්‍යාපාරයක නිරතවීමෙන් වරලත් හිමියාට සහ වරලත්ලාභියාට අත්කරගත හැකි වාසියක් බැගින් පිළිවෙලින් දක්වන්න.
43. වරලත් ව්‍යාපාරවල සීමා දෙකක් දක්වන්න.
44. ලහිරු විසින් තමා ඉතිරි කරගත් මුදල් සහ ඉඩමක් විකුණා ලබාගත් මුදලින් විසිතුරු මසුන් අභිජනන මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී. දැඩි අධිෂ්ඨානයෙන් සහ කැපවීමෙන් කටයුතු කළ ලහිරු කෙටි කාලයකින් ප්‍රදේශයේ ජනප්‍රිය සුරතල් මසුන් අලෙවි කරන ව්‍යාපාරිකයෙකු විය. ඔහු තම ව්‍යාපාරය "ලහිරු ඇක්වේරියම්" ලෙස නම් කළ අතර, එම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අදහස් කරගෙන සිටියි.

    සේවකයන් කිහිප දෙනෙකු බඳවා ගනිමින් ව්‍යාපාරය පුළුල් කළ අතර, ඔහුට ව්‍යාපාරයේ කටයුතු සඳහා මුදල් අවශ්‍ය වූ අතර, ඒ සඳහා ප්‍රාග්ධන සම්පාදන මාර්ගයක් සොයා බලමින් සිටියි. ඔහුගේ මිතුරන් දෙදෙනෙකු ඔහුගේ ව්‍යාපාරයට සම්බන්ධවීමට කැමැත්තෙන් පසු වුවත්, ඔහු ඔවුන් සමඟ මතභේද ඇති වේ යැයි බියෙන් පසුවෙයි.

    ඉහත ඡේදය ඇසුරින් පහත දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

    I. ලහිරු විසින් ආරම්භකළ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත් වේද?
    II. ඔහු ව්‍යාපාරය සඳහා ප්‍රාග්ධනය සපයාගත් ආකාරය දක්වන්න.
    III. ලහිරුට තම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සම්බන්ධව ඔබට ලබාදිය හැකි උපදෙස කුමක්ද?
    IV. ව්‍යාපාර කටයුතු සඳහා ලහිරු ඔහුගේ මිතුරන් සම්බන්ධ කර ගතහොත් දැනට පවතින ව්‍යාපාරය කවර ව්‍යාපාර සංවිධානයක් ලෙස වෙනස් වේද?
    V. නව ව්‍යාපාර සංවිධානය ගැටුම් , මතභේද වලින් තොරව පවත්වාගෙන යා හැක්කේ කෙසේද ?

45. සේනානි සේනාරත්න සහ ජයනි ජයරත්න එක්ව ආරම්භකළ රසකැවිලි නිෂ්පාදන ව්‍යාපාරය "ස්වීට් ෆුඩ්" නමින් ලියාපදිංචි කරන ලදී. ඔවුන් විසින් ඇති කරගත් හවුල් ගිවිසුමේ පහත කරුණු ඇතුළත්ව ඇත.
    - දෙදෙනාම රු. 100 000 බැගින් ප්‍රාග්ධනය යෙදිය යුතුය.
    - ලාභ අලාභ සම සමව බෙදාගත යුතුය.
    - ව්‍යාපාර කටයුතුවල නිරතවීම නිසා ජයනිට මාසිකව රු. 25 000ක වේතනයක් ගෙවිය යුතුය.
    - ප්‍රාග්ධනයට අතිරේකව ව්‍යාපාරයට යොදන ණය මුදල් සඳහා හවුල්කරුවෙකුට 10% ක වාර්ෂික පොළියක් ගෙවිය යුතුය.
    - යෙදූ ප්‍රාග්ධනය සඳහා 10% ක වාර්ෂික පොළියක් හිමි වේ.
    - නව හවුල්කරුවෙකු බඳවා ගන්නේ නම් ඒ සඳහා දෙදෙනාම කැමැත්ත පළ කළ යුතුය.

    තවද ඔවුන්ගේ නිෂ්පාදන පිළිබඳව පාරිභෝගිකයෙකු ස්වීට් ෆුඩ් ආයතනය නමින් නඩු පවරා ඇති බව දැනුම් දෙන ලදී.

    ඉහත සිද්ධිය ඇසුරින් පහත දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    I. හවුල් ගිවිසුමක් ඇතිවිය හැකි ආකාර මොනවාද?
    II. ඉහත තොරතුරු ඇසුරින් හවුල් ඔප්පුවක් පිලියෙල කරන්න.
    III. පාරිභෝගිකයා නඩු පැවරීම සම්බන්ධයෙන් ඔබේ අදහස, හවුල් ව්‍යාපාරයක මූලික ලක්ෂණ ඇසුරින් දක්වන්න.